# 10. වුළූ කරමු

අපි සලාතයට පෙර වුළූ කර ගනිමු. වුළූ කිරීමට ඉතා පිරිසිදු ජලය භාවිත කරමු. පළමු ව දැත සෝදා ගනිමු. පසු ව ජලයෙන් කට කලතා, නාස් පුඩු සෝදා ගනිමු. වුළූහි නීයියත් සමග මුහුණ සෝදමු. ඒ සමග ම දැත වැළමිට දක්වා සෝදමු. පසු ව හිස ජලයෙන් මස්හු කරමු. ඊට පසු ව කන් දෙක ම මස්හු කරමු. අවසාන වරට දෙපා වළලුකර දක්වා සෝදමු. මේ සෑම ක්‍රියාවක් ම තුන් වරක් බැගින් ඉටු කරමු. දකුණු පැත්ත පළමු ව කළ යුතු ය. මෙම ක්‍රියාවන් අනුපිළිවෙළින් ඉටුකරමු.












## පැවරුම්

**වරහන් තුළ ඇති වඩාත් ම සුදුසු වචනය යොදා මෙම වාක්‍ය ලියන්න.**

1. සලාත් කිරීමට පෙර (වුලූ කළ/පාද සේදිය) යුතු ය.
2. මුහුණ සෝදන විට වුලූ හි (දුආ/නීයියත්) සමග ඉටු කළ යුතු ය.
3. වුලූ කිරීමට අරඹා පළමුවෙන් ම (දැත්/කට) සේදිය යුතු ය.
4. වුලූ කරන විට (වම්/දකුණු) පැත්ත පළමු ව කළ යුතු ය.
5. වුලූ කරන විට සෑම ක්‍රියාවක් ම (තුන්/හතර) වරක් බැගින් ඉටු කළ යුතු ය.